## ශ්‍රී ලංකා පරිපාලන සේවයට බඳවා ගැනීම සඳහා වන විවෘත තරඟ විභාගය. – 2001

## ( 02 ) රචනය හා සාරාංශය

පැ දෙකයි

<u>ප්‍රශ්න දෙකටම පිළිතුරු සපයන්න.</u>

01. පහත සඳහන් මාතෘකා අතරෙන් එකක් තෝරා ගෙන රචනයක් ලියන්න.

( අ ) අධ්‍යාපන මාධ්‍යය වශයෙන් ඉංග්‍රීසි භාෂාව

( ආ ) රුපියලේ අගය වෙනස් වීම හා එහි ප්‍රතිවිපාක

( ඇ ) ලෝක සංස්කෘතික උරුමයන් ආරක්ෂා කිරීම.

( ඈ ) " ගීතයද සාහිත්‍යාංගයකි "

( ඉ ) ජල සම්පත් කළමණාකරණය

( ඊ ) බලය බෙදා හැරීමේ සංකල්පය

02. පහත දැක්වෙන පාඨය කියවා එහි වචන සංඛ්‍යාව තුනෙන් එකක් පමණ වන සේ සාරාංශ කොට ලියා සුදුසු මාතෘකාවක්ද යොදන්න. වචන ගණනද දක්වන්න.

කුටුම්බය සංකල්පයන කිරීමේදී විවිධ නිර්ණායක කාණ්ඩ තුනක් උපයෝගි කර ගත හැකිය. එනම් නිවාස ලේ ඥාතිත්වය හෝ ආර්ථික ක්‍රියාකාරිත්වයන්ය. පළමුව, එක් නේවාසික ගෘහ ඒකකයක් හෝ වාසස්ථාන සමූහයක් වැනි භෞතික සාධක අනුව කුටුම්බය දෙස බැලිය හැකිය. දෙවනුව, එම ව්‍යුහය තුළ වාසය කරන පුද්ගලයින් වර්ගය අනුව කුටුම්භයක් දෙස බැලිය හැකිය. බොහෝ සමාජයන්හි ගෘහ කණ්ඩායම් ඥාතීත්වය මත පදනම් වන අතර, කුටුම්බයක් සමන්විත වන්නේ කුමකින්ද, එසේම එකිනෙකට කෙතරම් වෙනස් ආකාරයෙන් කුටුම්බයන් සබඳතා පවත්වන්නේද යන කරුණු අර්ථ වශයෙන් හෝ තීරණය වන්නේ සංස්කෘතික විශේෂ ඥාතීත්ව සම්බන්ධතා තුලින් බව කුටුම්බයන් සම්බන්ධ සාහිත්‍යයේ වැඩි හරියකින් හඳුනා ගත හැකිය. තෙවනුව එහි ක්‍රියාකාරකම් එනම් ආර්ථික පැවැත්ම සුරක්ෂිත කරනුවස් කුටුම්බ සාමාජිකයින් කරන කාර්යය අනුවද එය විග්‍රහ කළ හැකි වේ.

කුටුම්බය පිළිබඳ ලේඛනයන්හි කුටුම්බය යන්න පුළුල්ම මට්ටමෙන් අර්ථ නිරූපනය වේ. සාමාන්‍යයෙන් ලේ නෑකම් වටා සැකසෙන නෙවාසික ඒකකයක් වශයෙනි. කුටුම්බ සාමාජිකයෝ ඉඩකඩ පමණක් නොව, සමහර ක්‍රියාකාරකම් සමූහයන්ද බෙදා ගනිති. එහි මූලික සාධකය වන්නේ සම්පත්වයයි. වංශ පරම්පරාව අනුව නිර්වචනය කරනු ලැබ ඇති ලේ නෑකම මත පවුල